
# මාසික විවරණිකාව

## 2009 දෙසැම්බර්



## ශ්‍රී ලංකා මහ බැංකුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

# විවරණිකාව

59 වැනි වෙළුම    12 වැනි කලාපය

**2009 දෙසැම්බර්**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථකථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථායන්හිදී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේ දී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළ යුතුය.

**ISSN 1391 - 3654**

ප්‍රකාශය : ශ්‍රී ලංකා මහ බැංකුව 

පටුන

## පිටුව


පළමුවැනි කොටස - මාසික සිදුවීම් 05

දෙවැනි කොටස - පුවත්පත් නිවේදන, පුවත්පත් දැන්වීම් සහ දේශන - 2009 දෙසැම්බර් 07

1. 2009 නොවැම්බර් මාසයේ උද්ධමනය 07
2. GSP+ සම්බන්ධයෙන් මහ බැංකුවේ ස්ථාවරත්වය පිළිබඳව ඇති වැරදි මතිමතාන්තර 08
3. ණය පත් මත අය කෙරෙන පොලී අනුපාතයන් පහත හෙළීමේ අවශ්‍යතාව 09
4. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2009 දෙසැම්බර්
   1977 ට පසුව ප්‍රථම වරට 2009 වසර තුළ දී වර්තන ගිණුමේ අතිරික්තයක් වාර්තා වීමට අපේක්ෂිතය 10
5. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ කළමනාකරණ නියෝජිතයා ලෙස පීපල්ස් ලීසිං කම්පැනි ලිමිටඩ් ආයතනය පත්කිරීම 11
6. ලියාපදිංචි මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට පවත්නා විශේෂ හේතු මත දෙනු ලබන බැංකු ණය පහසුකම් සඳහා ඇප ආවරණ ක්‍රමයක් හඳුන්වාදීම 11
7. 2009 ඔක්තෝබර් මාසයේ විදේශ වෙළෙඳමේ ක්‍රියාකාරිත්වය 12
8. කෘෂිකාර්මික ණය සඳහා පොලී පහත දැමීම 14
9. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) 14

1 වන කොටස

# මාසික සිදුවීම්

2009 දෙසැම්බර්

## රාජ්‍ය මූල්‍ය අංශය

- තිරිඟු ඇට ආනයනය සඳහා සම්පූර්ණ බදු අත්හැරීමක් (සියයට 15 ක් හෝ කිලෝග්‍රෑමයකට රුපියල් 10 ක් යන දෙකෙන් ඉහළ අගය) ලබා දෙන ලදී.

- සහල් ආනයනය කිරීමේ දී රේගුවේ දී අයකර ගනු ලබන වෙනත් සියලුම බදු වෙනුවට විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක් පනවන ලද අතර, අදාළ බදු අනුපාතය කිලෝග්‍රෑමයට රුපියල් 1 කි.

- සීනි ආනයනය සඳහා වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයට රුපියල් 6 සිට කිලෝ ග්‍රෑමයට රුපියල දක්වා අඩු කරන ලදී.

- පෙට්‍රල් සඳහා වූ බදු අත්හැරීම ලීටරයට රුපියල් 19 සිට ලීටරයට රුපියල් 34 දක්වා ඉහළ නංවන ලදී. ඒ අනුව, දැනට අදළ බදු අනුපාතය ලීටරයට රුපියලක් වේ.

### වෙනත්

- පෙට්‍රල් ලීටරයක සිල්ලර මිල ලීටරයට රුපියල් 115 දක්වා රුපියල් 15කින් අඩු කරන ලදී.

- කිලෝ ග්‍රෑම් 12.5 ක් වූ ලාෆ් ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,421 ක් දක්වා රුපියල් 60 කින් ඉහළ නංවන ලදී.

## ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද ණය

මහ කොළඹ අපජලය කළමනාකරණ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2009 දෙසැම්බර් 18 වැනි දින ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර ගිවිසුම් දෙකකට අත්සන් තබන ලදී. ඊට අදාළ කොන්දේසි පහත පරිදි වේ.

1. එ.ජ.ඩොලර් මිලියන 80 ක් වන (ආසන්න වශයෙන් රුපියල් මිලියන 9,138) ණය මුදල සඳහා වාර්ෂිකව ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතිකය මත 0.6 ක ආන්තිකයක් ඇතුළත් පොලී අනුපාතිකයක් ද, ප්‍රයෝජනයට නොගත් ශේෂය මත වාර්ෂිකව සියයට 0.15 ක අනිවාර්ය ගෙවීමක් ද අදළ වේ. වසර 5 ක සහන කාලයකට යටත්ව වසර 25 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතු වේ.

2. විශේෂ ගැනුම් හිමිකම් මිලියන 12.76 ක් වන (ආසන්න වශයෙන් රුපියල් මිලියන 2,290) ණය මුදල සඳහා ප්‍රයෝජනයට ගන්නා ණය මුදල මත සහන කාලය තුළ දී සියයට 1.0 ක් සහ ඉන්පසුව සියයට 1.5 ක් වශයෙන් වන වාර්ෂික පොලී අනුපාතිකයන් අදළ වේ. වසර 8 ක සහන කාලයකට යටත්ව වසර 32 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතු වේ.

## නෙදර්ලන්ත රජයෙන් ලද ණය

ආපද කළමනාකරණ හා හදිසි තත්ත්වයන් සඳහා ප්‍රතිචාර දක්වීමේ පද්ධතිය - අදියර I සහ II මූල්‍යනය කිරීම සඳහා 2009 දෙසැම්බර් 16 වැනි දින ශ්‍රී ලංකා රජය හා නෙදර්ලන්ත රබෝ බැංකුව අතර ගිවිසුම් දෙකකට අත්සන් තබන ලදී. ඊට අදළ කොන්දේසි පහත පරිදි වේ.

1. යුරෝ මිලියන 21.2 ක් වන (ආසන්න වශයෙන් රුපියල් මිලියන 3,526) ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 5.02 ක පොලී අනුපාතිකයක් අදළ වේ. වසර 10 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතු අතර, ණය ලැබීම ආරම්භ වී මාස 6 කට පසු ආපසු ගෙවීම් ආරම්භ කළ යුතුය.

2. යුරෝ මිලියන 3.74 ක් වන (ආසන්න වශයෙන් රුපියල් මිලියන 622) ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 3.05 ක පොලියක් අදළ වේ. මෙම ණය මුදල අනුක්‍රමික වාරික දෙකකින් අර්ධ වාර්ෂිකව ගෙවා අවසන් කළ යුතුය.

## චීනයේ ආනයන-අපනයන බැංකුවෙන් ලද ණය

පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ II වැනි අදියර මූල්‍යනය කිරීම සඳහා 2009 දෙසැම්බර් 25 වැනි දින ශ්‍රී ලංකා රජය හා චීන ආනයන-අපනයන බැංකුව අතර එ.ජ.ඩොලර් මිලියන 891 (ආසන්න වශයෙන් රුපියල් බිලියන 102) ක ණය මුදලක් සඳහා ගිවිසුමකට අත්සන් කරන ලදී. මෙම ණය මුදල සඳහා සියයට 2.0 ක වාර්ෂික පොලී අනුපාතිකයක් ද, ණය මුදල මත සියයට 0.5 ක කළමනාකරණ ගෙවීමක් ද, ප්‍රයෝජනයට නොගත් ශේෂය මත සියයට 0.5 ක අනිවාර්ය ගෙවීමක් ද අදළ වේ. වසර 5 ක සහන කාලයකට යටත්ව වසර 20 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

## සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්ගෙන් ලද ප්‍රදාන

කඩිනමින් ඉඩම් එළිපෙහෙළි කිරීමේ / මට්ටම් කිරීමේ හා වාසස්ථාන සැපයීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2009 දෙසැම්බර් 30 වැනි දින ශ්‍රී ලංකා රජය හා සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් අතර රුපියල් මිලියන 229 ක ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.

## එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන යටතේ ලද ප්‍රදාන

ආහාර සහනාධාර වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 134.91 (ආසන්න වශයෙන් රුපියල් බිලියන 15.4 ක) ප්‍රදානයක් සඳහා 2009 දෙසැම්බර්

30 වැනි දින ශ්‍රී ලංකා රජය හා එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන අතර ගිවිසුමකට අත්සන් තබන ලදී.

**එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ලද ප්‍රදාන**

මානව හිමිකම් සුරැකීම සම්බන්ධ හවුල් වැඩසටහන මූල්‍යනය කිරීම සඳහා 2009 නොවැම්බර් මස 25 වැනි දින ශ්‍රී ලංකා රජය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන අතර එ.ජ.ඩොලර් මිලියන 0.3 (ආසන්න වශයෙන් රුපියල් මිලියන 34) ක ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.

**ස්විට්සර්ලන්ත රජයෙන් ලද ප්‍රදාන**

යාපනය නිවාස වැඩසටහන මූල්‍යනය කිරීම සඳහා 2009 දෙසැම්බර් 25 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ස්විට්සර්ලන්ත රජය අතර එ.ජ.ඩොලර් මිලියන 1.25 (ආසන්න වශයෙන් රුපියල් මිලියන 143) ක ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් කරන ලදී.

**ජපාන රජයෙන් ලද ප්‍රදාන**

සූර්ය විදුලිබල උත්පාදන පද්ධතිය මගින් පිරිපහදු කළ බලශක්තිය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2009 දෙසැම්බර් 04 වැනි දින ශ්‍රී ලංකා රජය හා ජපාන රජය අතර ජපන් යෙන් මිලියන 860 (ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.1) ක ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් කරන ලදී.

**<u>මාසය තුළ සිදු වූ අමතර ණය මුදල් ලැබීම් සහ ණය කොන්දේසි වෙනස් කිරීම්.</u>**

**ඔස්ට්‍රියානු යුනික්‍රෙඩිට් බැංකුවෙන් ලද ණය**

සෙල්ලකතරගම ජල පිරිපහදු කිරීමේ අතිරේක ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා අමතර අරමුදල් වශයෙන් යුරෝ මිලියන 0.834 (ආසන්න වශයෙන් රුපියල් මිලියන 143) ක ණය මුදලක් සඳහා ශ්‍රී ලංකා රජය හා ඔස්ට්‍රියානු යුනික්‍රෙඩිට් බැංකුව අතර 2009 දෙසැම්බර් 4 වැනි දින ගිවිසුමකට අත්සන් තබන ලදී. අමතර ණය පහසුකම සඳහා රක්ෂණ ගාස්තු වශයෙන්, යුරෝ 13,668 ක් ණය මුදල ලද වහාම සහ වාර්ෂිකව ණය මුදලින් සියයට 1.61 ක් වශයෙන් ගෙවිය යුතු වේ. වසර 5.5 ක සහන කාලයකට යටත්ව වසර 15.5 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිමකළ යුතු වේ.


**ප්‍රංශ ජනරජයෙන් ලද ණය**

ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා යුරෝ මිලියන 2.5 (ආසන්න වශයෙන් රුපියල් මිලියන 414) ක අමතර ණය මුදලක් සඳහා 2009 දෙසැම්බර් 17 වැනි දින ශ්‍රී ලංකා රජය හා ප්‍රංශ ජනරජය අතර ගිවිසුමකට අත්සන් තබන ලදී. මේ සඳහා 2005 දෙසැම්බර් 14 වැනි දින අත්සන් කරන ලද මුල් ගිවිසුමෙහි අඩංගු කොන්දේසි අදාළ වේ.

## *II වන කොටස*
# පුවත්පත් නිවේදන
## *2009 දෙසැම්බර්*

### 01. 2009 නොවැම්බර් මාසයේ උද්ධමනය

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලද කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට (කො.පා.මි.ද.) (2002=100) අනුව වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතය, 2008 නොවැම්බර් සිට 13 වන මාසයටත් ක්‍රමයෙන් අඩු වෙමින්, 2009 ඔක්තෝබර් මාසයේ දී පැවැති සියයට 5.2 හි සිට නොවැම්බර් වන විට සියයට 4.1 දක්වා පහත වැටිණි. කෙසේ නමුත්, 2008 වර්ෂයේ නොවැම්බර් මාසයේ පහළ පදනම හේතුවෙන් ඇති වූ බලපෑම පිලිබිඹු කරමින් අපේක්ෂා කරන ලද පරිදි ලක්ෂ්‍යමය පදනම මත උද්ධමන අනුපාතය සියයට 2.8 දක්වා ඉහළ නැගිණි. මේ අතර, කො.පා.මි. දර්ශකයේ භාණ්ඩ පැසෙහි ආහාර නොවන හා බලශක්ති නොවන අයිතමයන්හි මිල විචලනය මනිනු ලබන මූලික උද්ධමනය, පූර්ව මාසයේ ලක්ෂ්‍යමය පදනම මත පැවැති සියයට 5.1හි ම ස්ථාවරව පැවැති අතර වාර්ෂික සාමාන්‍ය පදනම මත උද්ධමන අනුපාතය හය වන මාසයටත් අඛණ්ඩව පහත වැටිණි.*




2009 ඔක්තෝබර් මාසයේ දී 209.4හි පැවැති දර්ශක අගය 211.0 දක්වා ඉහළට ගමන් කිරීමත් සමග ම 2009 නොවැම්බර් මාසයේ දී කො.පා.මි. දර්ශකයෙහි පූර්ව මාසයට වඩා සියයට 0.8 ක සුළු ඉහළ යෑමක් දක්නට ලැබිණි. මූලිකව ම එළවළු, දෙහි, ඇණු, සුදු ඇණු සහ පොල් මිල ඉහළ යෑම හේතුවෙන් ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයේ මිල ඉහළ යෑම (සියයට 1.4) මෙම මාසික ඉහළ නැගීමට ප්‍රධාන වශයෙන් දායක විය.

කෙසේ වුවද, මත්ස්‍ය හා මුහුදු ආහාර, බිත්තර, පළතුරු, පරිප්පු සහ සීනි මිලෙහි පහළ යෑමක් වාර්තා විය. තවද, ප්‍රවාහනය (සියයට 0.2), රෙදිපිළි සහ පාවහන් (සියයට 1.1), විවිධ භාණ්ඩ හා සේවා (සියයට 1.1) සහ ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ, හා දෛනික ගෘහ නඩත්තු (සියයට 0.1) යන උප කාණ්ඩයන් ද මෙම ඉහළ යෑම කෙරෙහි දායක විය.

## 2. GSP+ සම්බන්ධයෙන් මහ බැංකුවේ ස්ථාවරත්වය පිළිබඳව ඇති වැරදි මතිමතාන්තර

*අවදනම් කළමනාකරණ දෘෂ්ටි කෝණයට අනුව GSP+ සහනයෙන් ශ්‍රී ලංකාවට ඇති බලපෑම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇගයීමකට ලක්කර, 2009 ඔක්තෝබර් 29 වන දින මාධ්‍ය වෙත ඉදිරිපත් කරන ලදී. මෙම විග්‍රහයෙහි පිටපතක් www.cbsl.gov.lk යන වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.*

ප්‍රතිචාර සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවරත්වය පිළිබඳ බොහෝ විශ්ලේෂකයන් එකඟ වූ බව අප විසින් දුටු අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරිපත් කළ සත්‍ය දත්ත සම්බන්ධයෙන් විරුද්ධ වීමට කිසිවෙකුටත් හැකිවූයේ නැත. කෙසේ වෙතත්, කාලයකට පසුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්ලේෂණය පිළිබඳව පුද්ගලයන් කිපදෙනෙකු අසාධාරණ ලෙස විවේචනයන් එල්ල කළ අතර, එනිසා ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවරත්වය නැවත ප්‍රකාශ කිරීමට සහ සමහර වැරදි මතිමතාන්තරවල පවතිනදුර්වලතා ඉස්මතු කිරීම සඳහාත් මෙම පුවත්පත් නිවේදනය නිකුත් කරනු ලැබේ.

දැනටමත් පෙන්වා දී ඇති පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවරත්වයට අනුව 2008 වර්ෂයේ අගභාගයේ සහ 2009 වර්ෂයේ මුල් කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, යූරෝ සහ බ්‍රිතාන්‍ය පවුම් යන මුදල් ඒකක දෙකටම සාපේක්ෂව සැලකිය යුතු ලෙස අධිප්‍රමාණය වීමේ දී ද අපනයනකරුවන්ට ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ තරගකිරීමට හැකි වූ බැවින්, එම මුදල් වර්ගවලට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම නිසා අපනයනකරුවන්ට දැන් පෙරටත් වඩා හොඳින් ක්‍රියාකිරීමේ හැකියාවක් තිබිය යුතුය.

ආයෝජකයින්ගේ විශ්වාසය වැඩිදියුණු වීමත් සමග දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට ඉහළ මට්ටමක විදේශ විනිමය ප්‍රමාණයක් ගලා එන අතර එමගින් රුපියල අධිප්‍රමාණය වීමට දැඩි බලපෑමක් ඇති කරනු ලබයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව ඉහළ පිරිවැයක් දරමින් විදේශ විනිමය වෙළෙඳපොළට නිරන්තරව මැදිහත් වෙමින් විදේශ විනිමය අවශෝෂණය කිරීම නිසා ශ්‍රී ලංකාවට, විනිමය අනුපාතිකය වර්තමානයේ පවතින මට්ටමෙහි ස්ථාවරව පවත්වාගෙන යාමට සහ අපනයනකරුවන්ට අහිතකර බලපෑම් ඇතිවන පරිදි රුපියල තියුණු ලෙස අධිප්‍රමාණය වීම වැළැක්වීමට හැකි විය. බොහෝ අපනයනකරුවන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගයන් අගය කොට සලකනු ලැබුව ද, සිය ව්‍යාපාරය තවදුරටත් පවත්වාගෙන යාමට අපහසු බව එක් අපනයනකරුවකු විසින් තර්ක කරනු ලබන අතර, ස්ටර්ලිං පවුමට එරෙහිව ශ්‍රී ලංකා රුපියල 2004 දී පැවැති මට්ටම දක්වා අවප්‍රමාණය වනු ඇතැයි ද බලාපොරොත්තු වේ. තවත් අපනයනකරුවෙකු තර්ක කරනු ලබන්නේ, සිය අපනයනයන් එ.ජ.ඩොලරයට අනුව මිල කරන නිසාවෙන් යූරෝ සහ ස්ටර්ලිං පවුමට එරෙහිව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම මගින් සිය සමාගමට ප්‍රමාණවත් සහායක් නොලබන බවයි. මෙවැනි ඒකපුද්ගලවාදී සහ පරස්පර විරෝධී තර්කයන් හේතුවෙන් සාමාන්‍ය මහජනතාව ව්‍යාකූලත්වයට පත්වන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විනිමය අනුපාතික ප්‍රතිපත්ති සකස් කිරීම සිදුකරන්නේ ඒක පුද්ගල ආයතනයන්ගේ සීමිත වරණයන් සලකා බැලීමට වඩා සමස්ත සාර්ව ආර්ථික සාධක සලකා බැලීම තුළින් බව ශ්‍රී ලංකා මහ බැංකුව නැවත නැවතත් අවධාරණය කෙරේ.

ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ශ්‍රී ලාංකීය නිෂ්පාදනයන්ගේ තරගකාරිත්වයට පහත දක්වා ඇති වැදගත් සාධකයන් මගින් ද බලපෑම් ඇති කරන බවට ද අවධානය යොමු කළයුතු වේ. විශේෂයෙන් (අ) දේශීය උද්ධමනය සහ යෙදවුම් පිරිවැය (ආ) ආරක්ෂාව සහ දේශපාලනික ස්ථායීතාවය (ඇ) තාක්ෂණිකමය වැඩිදියුණු කිරීම්, ආයතනික සැකසීම සහ පාරිසරික ප්‍රමුඛතාවයන් නනි ආයතනයන් මගින් ප්‍රධාන වශයෙන්ම වැඩිදියුණු කළයුතු ප්‍රමුඛතාවයන්, යනාදී කරුණු මෙයට අයත් වේ. මේ අනුව, දැනට පවත්නා අඩු උද්ධමනකාරී පසුබිම, අඩු උද්ධමන අපේක්ෂාවන් සහ පොලී අනුපාතිකයන් පහත වැටීම මගින් අපනයන ද ඇතුළත්ව සමස්ත ව්‍යාපාරික පරිසරයකට සතුටුදායක සහායක් ලබාදෙයි.

තවද, බාහිර ආයතන හෝ රටවල් මගින් පාලනය කරනු ලබන තාවකාලික වාසි මත දැඩි විශ්වාසයක් පවත්වාගෙනයාමේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිග්‍රාහක ආර්ථිකයන්ට මූලික සහ ව්‍යුහාත්මක ගැටලු රැසකට මුහුණ දීමට සිදුවන බව තවදුරටත් සඳහන් කළ යුතු වේ. සහන ඉවත්කර ගන්නා බවට වරින් වර සිදුකරන තර්ජන සහ ඒ පිළිබඳ උනන්දුව ඇති පාර්ශ්වයන්ගේ දැඩි ලෙස "දේශපාලනීකරණය" වූ එවැනි සහන, ආර්ථිකමය සෘණාත්මක කම්පනයන් කරා ගෙන යනු ලබයි. මෙවැනි අවිනිශ්චිතතාවයන් මගින් ආර්ථික ශක්තියේ වේගය අඩාල කරවන අතර, ආයතනයන් විසින් සිදුකරනු ලබන ඵලදායීතා වර්ධනයන් හඳුන්වාදීම් ද ප්‍රමාද කරවනු ලබයි. මෙම කරුණු මෙන්ම, පවතින "සහනයන්" මත රඳා පැවතීමේ සමහර අයහපත් ප්‍රතිඵල දීර්ඝකාලීන වශයෙන් තිරසාර අපනයන ප්‍රවර්ධනයට බාධකයක් ද විය හැකිය.

ශ්‍රී ලංකා රුපියල ප්‍රමාණවත් අයුරින් අවප්‍රමාණය නොවීම සහ අපනයන අංශය වෙත රාජ්‍ය මූල්‍ය සහනාධාරයන් අඩුවීම හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2009 පළමු මාස නවය තුළ දී ශ්‍රී ලංකාවේ අපනයන සියයට 16.8 කින් පහත වැටුණු බවට මෑත දී විවේචනයන් ද ඉදිරිපත් ව තිබුණි. ඒ

අනුව, 2009 වසරේ දී අපනයනයන්ගේ සිදු වූ පහත වැටීම් ශ්‍රී ලංකාවට පමණක් විශේෂිත වූ හෝ අසාමාන්‍ය අවස්ථාවන් නොවන බව පෙන්වා දීම වැදගත් වේ. දෙවන ලෝක යුද්ධයෙන් පසුව පැවති දරුණුතම ගෝලීය ආර්ථික අර්බුදය හේතුවෙන් ලොවපුරා අපනයනයන් පහත වැටුණු බව ප්‍රකට කරුණකි. බොහෝ රටවල පැවැති අපනයන පහත වැටීම පහතින් දක්වා ඇති සංඛ්‍යා සටහනින් පෙන්නුම් කරනු ලබයි.

**සංඛ්‍යා සටහන : අපනයන ක්‍රියාකාරිත්වය සැසඳීම**

| | ජනවාරි - සැප්තැම්බර් | | |
|---|---|---|---|
| | 2008 (එ.ජ.ඩො.බිලි.) | 2009 (එ.ජ.ඩො.බිලි.) | වර්ධනය % |
| එක්සත් රාජධානිය | 191.1 | 167.6 | -12.3 |
| ශ්‍රී ලංකාව | 6.2 | 5.1 | -16.8 |
| පකිස්ථානය | 15.6 | 12.8 | -17.8 |
| ප්‍රංශය | 313.6 | 252.0 | -19.6 |
| ද.කොරියාව | 328.9 | 260.5 | -20.8 |
| තායිලන්තය | 137.0 | 108.1 | -21.1 |
| චීනය | 1,074.4 | 846.8 | -21.2 |
| ඇ.එ.ජනපදය | 982.9 | 755.0 | -23.2 |
| සිංගප්පූරුව | 373.7 | 282.9 | -24.3 |
| ඉන්දියාව | 148.9 | 109.9 | -26.2 |
| ස්පාඤ්ඤය | 219.2 | 158.2 | -27.8 |
| පිලිපීනය | 38.9 | 27.6 | -28.9 |
| තායිවානය | 204.4 | 143.8 | -29.7 |
| ග්‍රීසිය | 22.8 | 15.5 | -32.0 |
| ජපානය | 603.6 | 405.9 | -32.7 |
| ඉතාලිය | 250.6 | 167.9 | -33.0 |
| රුසියාව | 370.9 | 206.6 | -44.3 |

මූලයන් : රොයිටර්ස් සහ බ්ලූම්බර්ග්

2008 අගභාගයේ සහ 2009 මුල් භාගයේ දී ඉහත දක්වා ඇති බොහොමයක් රටවල විනිමය අනුපාතිකයන් එ.ජ.ඩොලරයට එරෙහිව තියුණු අන්දමින් අවප්‍රමාණය වීමක් සිදුවුවද, ගෝලීය ආර්ථික අර්බුදය හමුවේ අනෙකුත් දියුණු වෙමින් පවතින වෙළෙඳපොළවල් සහ සංවර්ධිත රටවල් බොහොමයකට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ අපනයන අංශය යහපත් ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ බව ඉහත සංඛ්‍යාවලින් පැහැදිළි වේ. ඇතැම් අපනයනකරුවන්ට වඩාත් ඵලදායී ලෙස තරගකිරීමේ හැකියාවක් නොමැති වීම සහ එනිසාම බදු ගෙවන්නන්ගේ සහාය සහ/හෝ මුදල් අවප්‍රමාණයක් අපේක්ෂා කරන තත්ත්වයක් පැවතිය ද, මෙම ප්‍රතිඵලය මගින් සනාථ වන්නේ ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් බොහොමයක් දුෂ්කර විදේශීය වාතාවරණය මධ්‍යයේ වුවද, සිය ඵලදායීතාව නංවාගැනීම තුළින් සාර්ථක ලෙස තරගකාරිත්වයට මුහුණ දීමට සමත් වූ බවයි.

විනිමය අනුපාතික ප්‍රතිපත්තීන් සැකසීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපනයන, ආනයන, උද්ධමනය, ජීවන වියදම, ණය, ආයෝජනය සහ පරිභෝජනය, අභ්‍යන්තර සහ බාහිර තුලනයන් ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ප්‍රධාන මුදල්වල වෙළෙඳපොළ විචලතාවයන් ආදී කරුණු පිළිබඳව සලකා බලනු ලැබේ. ඒ අනුව මෙය, සමස්ත රටෙහිම යහපත වෙනුවෙන් ප්‍රවේශමෙන් සලකා බලා ගනු ලැබූ වෘත්තිමය තීරණයක් වන අතර, සමහර අයගේ පෞද්ගලික රුචිකතාවයන් සහ තනි කැමැත්ත මත ක්‍රියාත්මක කරවනු ලබන පක්ෂග්‍රාහී තීරණයක් නොවේ.

## 3. ණය පත් මත අය කෙරෙන පොලී අනුපාතයන් පහත හෙළීමේ අවශ්‍යතාව

*බලපත්‍රලාභී බැංකු විසින් ණය පත් මත අය කරන පොලී අනුපාතයන් 2008 දෙසැම්බර් මාසයේ සිටම සියයට 33 සිට සියයට 48 දක්වා වන පරාසයක නොවෙනස්ව පවත්නා බව මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත.*

එනමුත්, මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම තුළින් පොලී අනුපාත ව්‍යුහයේ අගයන් පහත වැටී ඇති හෙයින් මේ වන විට ණය පත් සඳහා වන පොලී අනුපාත අඩු කිරීම සඳහා ප්‍රමාණවත් පසුබිමක් සැකසී ඇති බව පෙනී යයි.

ඒ අනුව ණය පත් මත පනවා ඇති පොලී අනුපාත අවම වශයෙන් සියයට 24 ත්, සියයට 36 ත් අතර මට්ටමකටවත් පහත හෙළීමට ක්‍රියා කරන ලෙස මහ බැංකුව විසින් බැංකු වෙත දැනුම් දෙනු ලැබ ඇත.

# 4. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2009 දෙසැම්බර්
## 1977 ට පසුව ප්‍රථම වරට 2009 වසර තුළ දී වර්තන ගිණුමේ අතිරික්තයක් වාර්තා වීමට අපේක්ෂිතය

*ලක්ෂ්‍යමය උද්ධමනය සියයට 2.8 දක්වා ඉහළ ගිය ද, 2009 නොවැම්බර් මස අවසානය වන විට වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 4 ක් වැනි මට්ටමක පැවතීම තුළින් පිළිබිඹු වන පරිදි උද්ධමනාත්මක පීඩනය අඛණ්ඩව පහත් මට්ටමක පවතී. උද්ධමනය සඳහා වන පෙර දැක්ම ද යහපත් මට්ටමක පවතී. ඉදිරි කාලය තුළ උතුරු හා නැගෙනහිර පළාත්වල සිදුවන වර්ධනයත් සමග මෙම ප්‍රදේශ රටෙහි අන් ප්‍රදේශ හා වඩාත් ඒකාබද්ධ වනු ඇති අතර, රටෙහි භාණ්ඩ හා සේවා සැපයුම ඉහළ නැංවීමට ද මෙය උපකාරී වනු ඇත. දේශීය ආර්ථිකයෙහි සැපයුම් අංශය තුළ සිදුවනු ඇතැයි අපේක්ෂිත හිතකර වර්ධනයන් ඉදිරි කාලය තුළ උද්ධමනය මත හිතකර බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂිතය.*

අපනයන ආදායම පහත වැටීමේ වේගය අභිබවා ආනයන වියදම පහත වැටීමේ වේගය අභිබවා ආනයනවියදම පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස 2009 ප්‍රථම මාස නවය තුළ වෙළෙඳ හිඟය සැලකිය යුතු ලෙස අඩු වෙමින් පැවතුණි. වෙළෙඳ හා ආදායම් ගිණුම් තුළ පැවති හිඟයන් වර්තන පැවරුම් හා සේවා ගිණුම්වල ලැබීම් ඉහළයාම තුළින් සමනය වූ අතර, මේ තුළින් ප්‍රථම මාස නවය තුළ දී වර්තන ගිණුමේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 393 ක අතිරික්තයක් වාර්තා කිරීමට ද හැකි විය. මෙම වර්ධනයන් වසරේ අවසාන කාර්තුව තුළ දී එලෙසම පවතිනු ඇතැයි ද, ඒ අනුව 1977 න් පසුව ප්‍රථම වරට 2009 වසරේ දී වර්තන ගිණුමෙහි අතිරික්තයක් වාර්තා කිරීමට හැකිවනු ඇතැයි ද අපේක්ෂිතය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ලිහිල් මුදල් ප්‍රතිපත්තිය හා දැනට පවත්නා සුභවාදී ආයෝජන වාතාවරණය සහ ලෝක ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම යනාදී කරුණු හමුවේ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂාවන් ඉහළ ගොස් ඇත. එමනිසා මූල්‍ය වෙළෙඳපොළෙහි ඇති ස්ථායී වාතාවරණය සහ වෙළෙඳපොළ පොලී අනුපාතික පහත වැටීම හමුවේ ණය තත්ත්වයන් වඩාත් සුභවාදී අතට හැරී ඇති අතර, එමගින් ණය ප්‍රවාහයන් ක්‍රමයෙන් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉදිරි කාලය තුළ ප්‍රධාන වශයෙන් ශුද්ධ විදේශ වත්කම් වර්ධනය වීම සහ පෞද්ගලික අංශය වෙත ලැබෙන ණය ප්‍රවාහ ඉහළ යෑම යනාදී කරුණු හේතුවෙන් පුළුල් මුදල් සැපයුම තවදුරටත් වර්ධනය වීම සිදුවිය හැකි වුවද, එහි වර්ධනය මෙම වසරට සහ ලබන වසරට මුදල් ඉල්කකයන් සකස් කිරීමේ දී සැලකිල්ලට ගෙන ඇත.

මෙකී කාරණා සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය විසින් 2009 දෙසැම්බර් මස 11 දින පැවති රැස්වීමේ දී මහ බැංකුවෙහි ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී. ඒ අනුව, ප්‍රතිමිල දී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික පිළිවෙළින් සියයට 7.50 ත් සහ සියයට 9.75 ත් ලෙස නොවෙනස්ව පවතී.

2010 වර්ෂයට අදාළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති උපාය මාර්ගයන් 2010 ජනවාරි 04 වැනි දින ප්‍රකාශයට පත් කෙරෙන 2010 සහ ඉන් ඉදිරි කාලය සඳහා මුදල් හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම තුළින් ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය 2010 ජනවාරි මස 19 වැනි දින ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

## 5. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ කළමනාකරණ නියෝජිතයා ලෙස පීපල්ස් ලීසිං කම්පැනි ලිමිටඩ් ආයතනය පත්කිරීම

*ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2009.12.16 දින සිට බලපැවැත්වෙන පරිදි ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයෙහි කළමනාකරණ නියෝජිත ලෙස පීපල්ස් ලීසිං කම්පැනි ලිමිටඩ් ආයතනය පත් කර ඇත. පීපල්ස් ලීසිං කම්පැනි ලිමිටඩ් ආයතනය මහජන බැංකුවේ පාලිත සමාගමක් වන අතර, එය කල්බදු ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති දෙවැනි විශාලතම කල්බදු මූල්‍යකරණ සමාගම වේ. ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ මුදල් සමාගමක් වන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට ලක් වේ.*

කළමනාකරණ නියෝජිත ලෙස පීපල්ස් ලීසිං කම්පැනි ලිමිටඩ් විසින්, 2009.02.25 දින කැබිනට් මණ්ඩල තීරණයට අනුව මුදල් මණ්ඩලය විසින් 2009.03.06 දින පත්කරනු ලැබූ ප්‍රවීන උපදේශක මණ්ඩලයේ උපදෙස් යටතේ, ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයෙහි සියලු ව්‍යාපාර කටයුතු කළමනාකරණය කරනු ඇත.

ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයන් තවදුරටත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස කටයුතු කළ යුතු අතර ඔවුන් සමාගමෙහි දැනට පවතින ගැටලු විසඳ ගැනීමටත් තැන්පත්කරුවන්ට සහ අනෙකුත් ණයහිමියන්ගේ වගකීම් නියමිත පරිදි ගෙවීමට හැකිවන ලෙස මූල්‍ය තත්ත්වය වැඩිදියුණු කරගැනීමටත්, ව්‍යාපාර කටයුතු සාමාන්‍ය ලෙස පවත්වාගෙන යාමටත්, කළමනාකරණ නියෝජිතයා වෙත සිය පූර්ණ සහයෝගය ලබා දිය යුතුය.

කළමනාකරණ නියෝජිතයා විසින් ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයෙහි මූල්‍ය තත්ත්වය සාධාරණ කාලයක් තුළ දී වැඩිදියුණු කරනු ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරනු ලබන අතර එහි ප්‍රගතිය සමීපව අධීක්ෂණය කරනු ලැබේ.

## 6. ලියාපදිංචි මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට පවත්නා විශේෂ හේතු මත දෙනු ලබන බැංකු ණය පහසුකම් සඳහා ඇප ආවරණ ක්‍රමයක් හඳුන්වාදීම

*ලියාපදිංචි මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අනපේක්ෂිත ලෙස ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දෙන අවස්ථාවල දී, එම ආයතනවලට බැංකු ආයතන විසින් දෙනු ලබන ණය පහසුකම් සඳහා නව ඇප ආවරණ ක්‍රමයක් ස්ථාපනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කර ඇත. මෙම ඇප ආවරණ ලබාදීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇප ආවරණ ක්‍රමය යටතේ පහසුකම් අයදුම් කරන ආයතනයට එසේ ණය ඇප ආවරණයක් ලබාගැනීමට ඇති මූල්‍ය අවශ්‍යතාවය සහ ණය අරමුදල් ලබාගැනීමේ දී උකස් කිරීමට යෝජිත වත්කම්වල ස්වභාවය තක්සේරු කරනු ඇත. එමෙන්ම, ඇප ආවරණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී කඩිනම් ක්‍රමවේදයක් අනුගමනය කරන අතර ඇප ආවරණ ලබාදීමේ දී ඇතැම් කොන්දේසි පැනවීමට කටයුතු කරනු ඇත.*

නව අරමුදල් ලැබීම් පහත වැටීම සහ ඇතැම් බැංකු ආයතන විසින් මෙම සමාගම්වලට ණය පහසුකම් ලබාදීමට අකැමැත්තක් දැක්වීම හේතුවෙන්, 2009 වසරේ ආරම්භයේ සිට සමහර මුදල් සමාගම් සහ කල්බදු මූල්‍යකරණ සමාගම් ද්‍රවශීලතා අපහසුතාවන්ට මුහුණ පා ඇත. මෙම නව ක්‍රමය මගින්, ඉහත ආකාරයේ අපහසුතාවයන්ට මුහුණ දී ඇති මුදල් සමාගම්වලට සහ කල්බදු මූල්‍යකරණ සමාගම්වලට, ඔවුන්ගේ ද්‍රවශීලතා මට්ටම වැඩිකර ගැනීමට සහ ව්‍යාපාර කටයුතු නොකඩවා කරගෙන යාම සඳහා එම සමාගම් සතු වත්කම්වලට එරෙහිව බැංකු ආයතනවලින් ණය මුදල් ලබාගැනීමේ හැකියාව ලැබෙනු ඇත.

මෙම ක්‍රමය යටතේ ලබාදෙනු ලබන ණය මුදල් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇප ආවරණය ලබා දෙන බැවින්, බැංකු ආයතනවලට ද අඩු අවදානමක් යටතේ, ලබාදෙන ණය ප්‍රමාණය වැඩි කර ගතහැකි අතර ණය වත්කම් විවිධාංගීකරණය කර ගැනීමට ඉඩ සැලසෙනු ඇත.


මෙම ඇප ආවරණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන්, ද්‍රවශීලතා අපහසුතාවන්ට පත්ව ඇති ලියාපදිංචි මුදල් සමාගම්වලට සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට ගලා එන අරමුදල් වැඩිවීමෙන් කෙටි කාලයක් තුළ ද්‍රවශීලතා ගැටලු මගහරවා ගැනීමට සහ ව්‍යාපාර කටයුතු සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට හැකිවීමෙන් රටෙහි ආර්ථික වර්ධනයට දායක වීමට ද හැකිවනු ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.


# 7. 2009 ඔක්තෝබර් මාසයේ විදේශ වෙළෙඳමේ ක්‍රියාකාරිත්වය

*2009 අප්‍රේල් මාසයේ සිට වර්ධනයක් පෙන්වූ අපනයන ආදයම, සැප්තැම්බර් මාසයේ දී වූ සුළු පසුබෑමකින් අනතුරුව ඔක්තෝබර් මාසයේ දී වර්ධනය විය. 2009 ඔක්තෝබර් මාසයේ දී ආනයනය වියදම ද ශීඝ්‍ර ලෙස වැඩි විය. කෙසේ වුවත්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට 2009 ඔක්තෝබර් මාසය තුළ දී අපනයන සහ ආනයන පිළිවෙළින් සියයට 4.9 සහ සියයට 18.0 බැගින් පහත වැටුණි.*

2009 ඔක්තෝබර් මාසයේ දී අපනයන ආදයම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 629 දක්වා පහත වැටුණි. එය පෙර වසර සමග සැසඳීමේ දී මෙම වසර තුළ දී මෙතෙක් පැවති අවම පහත වැටීම විය. ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟළුම්, ආහාර, පාන වර්ග හා දුම්කොළ, යන්ත්‍ර සූත්‍ර හා උපකරණයන් හි අපනයන අඩුවීම හේතුවෙන් කාර්මික අපනයනයන් සියයට 8.2 කින් පහත වැටීම මේ සඳහා විශාලතම දයකත්වයක් සැපයීය. කෙසේ වුවත්, මෙම මාසය තුළ දී රබර් නිෂ්පාදන අපනයන එ.ජ.ඩොලර් දශ ලක්ෂ 40.6 දක්වා සියයට 5.3 කින් වර්ධනය වූ අතර, වොල්කනයිස් කරන ලද රබර් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවත්, කෘෂිකාර්මික අපනයන අතුරින් තේ අපනයන තවදුරටත් යහපත් ක්‍රියාකාරිත්වයක් පෙන්වීය. තේ නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල් වන ඉන්දියාව, කෙන්යාව සහ ශ්‍රී ලංකාවෙහි තේ නිෂ්පාදනය අඩුවීම හේතුවෙන් "සිලෝන් තේ" ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ඉහළ මිලක් වාර්තා කරගත් අතර, තේ අපනයන ආදයම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 117 දක්වා සියයට 8.0 කින් වර්ධනය විය. කම්කරු අසහනය, දේශගුණික හේතු සහ සෘතුමය මිල දී ගැනීම් රටාවන් ආදිය නිසා ඔක්තෝබර් මාසය තුළ දී අපනයනය කරන ලද තේ ප්‍රමාණය අඩු විය. රබර් අපනයනයන් ද පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 2.0 කින් වර්ධනය වුවද, ඔක්තෝබර් මාසයේ දී රබර් අපනයන ආදයම සියයට 19.5 කින් පහත වැටුණි. මෙයට ප්‍රධාන හේතුව වූයේ 2008 ඔක්තෝබර් මාසය සමග සසඳන විට 2009 ඔක්තෝබර් මාසයේ පැවැතුණු අපනයන මිල අඩු මට්ටමක පැවතීමය. සුළු කෘෂිකාර්මික බෝග අපනයන ආදයම 2009 ඔක්තෝබර් මාසයේ දී සියයට 30.7 කින් වර්ධනය විය. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී 2009 පළමු මාස දහය තුළ දී සමුච්චිත අපනයන ආදයම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 5,748 දක්වා සියයට 15.6 කින් පහත වැටුණි.

2009 සැප්තැම්බර් මාසයේ සියයට 36.1 කින් පහත වැටුණු ආනයන වියදම, ඔක්තෝබර් මාසයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 998 ක් වූ අතර, එය සියයට 18.0 සාපේක්ෂ අඩු අනුපාතයකින් පහත වැටුණි. සමස්ත ආනයනයන්ගෙන් සියයට 56 ක දයකත්වයක් ලබාදුන් අන්තර් භාන්ඩ ආනයන එ.ජ.ඩොලර් දශ ලක්ෂ 618 දක්වා සියයට 16.7 කින් පහත වැටුණු අතර, පොහොර ආනයන වියදම පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවත්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී ඔක්තෝබර් මාසයේ ඛනිජ තෙල් ආනයන වියදම සියයට 20.3 කින් වර්ධනය වූ අතර, බොර තෙල් බැරලයක සාමාන්‍ය ආනයනික මිල එ.ජ.ඩොලර් 72.80 දක්වා සියයට 4.1 කින් ඉහළ යන ලදී. රෙදිපිළි හා ඇඟළුම් ආනයන ද එ.ජ.ඩොලර් දශ ලක්ෂ 129 දක්වා සියයට 23.9 කින් පහත වැටුණු අතර, 2009 වසර තුළ දී ඇඟළුම් අංශයේ වර්ධනය සාමාන්‍ය මට්ටමක පැවැතිය හැකි බව එමගින් පිළිබිඹු කරයි. ආනයනික ආහාර හා පාන වර්ග සඳහා වියදම අඩුවීම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයනයන් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 165 දක්වා සියයට 24.7 කින් පහත වැටුණි. මෝටර් රථ සහ විද්‍යුත් උපකරණ ආනයන අඩුවීම හේතුවෙන් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන ද පහත වැටුණි. යන්ත්‍ර සූත්‍ර සහ ගොඩනැගිලි ද්‍රව්‍ය යන උප කාණ්ඩයන්හි පහත වැටීම් පිළිබිඹු කරමින් ද, 2009 ඔක්තෝබර් මාසයේ දී ආයෝජන භාණ්ඩ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 207 ක් දක්වා සියයට 14.5 කින් පහත වැටුණි. කෙසේ වුවත්, භාණ්ඩ ප්‍රවාහනයට භාවිතකරන වාහන ආනයනය ඉහළ යාම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඉහළ ගියේය. 2008 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී, 2009 පළමු මාස දහය සඳහා සමුච්චිත ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 7,965 දක්වා සියයට 33.5 කින් පහත වැටුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2009 ඔක්තෝබර් මාසයේ දී වෙළෙඳ ශේෂය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 370 දක්වා සියයට 33.6 කින් අඛණ්ඩව පහත වැටුණි. 2008






වසරේ පළමු මාස දහය තුළ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 5,171 ක් ව පැවැති සමුච්චිත වෙළෙඳ ශේෂය, 2009 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,217 දක්වා සියයට 57.1 කින් පහත වැටුණි. මෙම කාලපරිච්ඡේදය තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,774 ක් දක්වා සියයට 12.9 කින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 2009 වසරේ පළමු මාස දහය තුළ දී වාර්තා වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, වෙළෙඳ හිඟය ට වඩා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 557 ක (සියයට 25 ක පමණ) අතිරික්තයක් පෙන්නුම් කර ඇත.

2009 නොවැම්බර් මාසය අවසන් වන විට, ආසියානු නිශ්කාෂණ සංගමයේ (ACU) ලැබීම් සහිතව සහ රහිතව දළ නිල සංචිත ප්‍රමාණය පිළිවෙළින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 5,308 ක් සහ 5,228 ක් ලෙස වාර්තා විය. එ.ජ.ඩොලර් දශ ලක්ෂ 262 ක් වූ භාණ්ඩාගාර බිල්පත් මත වූ කෙටිකාලීන ශුද්ධ ලැබීම් ද, එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,068 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර මත වූ ශුද්ධ ලැබීම් ද මීට ඇතුළත් වේ. පසුගිය මාස දෙළහ තුළ සිදු වූ සාමාන්‍ය ආනයනයන්ට අනුව (මසකට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 834) ආසියානු නිශ්කාෂණ සංගමයේ ලැබීම් සහිතව සහ රහිතව මෙම දළ නිල සංචිත පිළිවෙළින් මාස 6.4 ක සහ 6.3 ක ආනයන මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් වේ.

2009 දෙසැම්බර් 18 වැනි දින වන විට ආසියානු නිශ්කාෂණ සංගමයේ ලැබීම් රහිත දළ නිල සංචිත ප්‍රමාණය දළ වශයෙන් එ.ජ.ඩොලර් බිලියන 5.2 ක් පමණ වේ යැයි ඇස්තමේන්තු කොට ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය අඛණ්ඩව අවශෝෂණය කර ගැනීම සංචිතවල සිදු වූ සැලකිය යුතු වර්ධනයට මූලික වූ අතර, ඒ අනුව 2009 මාර්තු මාසය අවසානයේ සිට දෙසැම්බර් 18 වන දින දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළෙඳපොළෙන් ශුද්ධ වශයෙන් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,816 ක් අවශෝෂණය කරගන්නා ලදී. තවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් සමීපස්ථ ණය පහසුකමෙහි පළමු සහ දෙවන මුදහැරීම යටතේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 652 ක මුදලක් ලැබීම ද සංචිතවල මෙම වර්ධනයට හේතු විය.

මෙම කාලපරිච්ඡේදය සඳහා විදේශ වෙළෙඳමේ සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණයන්හි ක්‍රියාකාරිත්වය පහත සංඛ්‍යා සටහනින් තවදුරටත් පෙන්වා ඇත.

**විදේශ වෙළෙඳමෙහි ක්‍රියාකාරිත්වය - 2009 ඔක්තෝබර් සහ 2009 ජනවාරි - ඔක්තෝබර්**

| අයිතමය | 2008 ඔක්තෝබර් එ.ජ.ඩොලර් දශ ලක්ෂ | 2009 ඔක්තෝබර් එ.ජ.ඩොලර් දශ ලක්ෂ | ඔක්තෝබර් වර්ධනය (සියයට) | 2008 ජනː සිට ඔක්ː එ.ජ.ඩොලර් දශ ලක්ෂ | 2009 ජනː සිට ඔක්. එ.ජ.ඩොලර් දශ ලක්ෂ | ජනවාරි සිට ඔක්තෝබර් වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **661.2** | **628.7** | **-4.9** | **6,810.9** | **5,748.2** | **-15.6** |
| කෘෂිකාර්මික | 157.8 | 165.8 | 5.1 | 1,608.1 | 1,365.2 | -15.1 |
| මෙයින් තේ | 108.0 | 116.6 | 8.0 | 1,103.1 | 963.4 | -12.7 |
| කාර්මික | 497.0 | 456.4 | -8.2 | 5,090.9 | 4,307.3 | -15.4 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 284.0 | 263.3 | -7.3 | 2,808.3 | 2,666.8 | -5.0 |
| ඛනිජ ද්‍රව්‍ය | 6.4 | 6.5 | 2.2 | 112.0 | 75.6 | -32.5 |
| **ආනයන** | **1,217.7** | **998.2** | **-18.0** | **11,981.9** | **7,965.5** | **-33.5** |
| පාරිභෝගික භාණ්ඩ | 219.7 | 165.3 | -24.8 | 2,181.5 | 1,561.3 | -28.4 |
| අන්තර් භාණ්ඩ | 741.6 | 617.7 | -16.7 | 7,202.6 | 4,496.0 | -37.6 |
| මෙයින් ඛනිජ තෙල් | 226.0 | 271.9 | 20.3 | 3,022.8 | 1,697.8 | -43.8 |
| මෙයින් රෙදිපිළි සහ ඇඟළුම් | 169.2 | 128.8 | -23.9 | 1,413.7 | 1,168.9 | -17.3 |
| ආයෝජන භාණ්ඩ | 242,1 | 206.9 | -14.5 | 2,485.4 | 1,810.3 | 27. 2 |
| **වෙළෙඳ ශේෂය** | **-556.5** | **-369.6** | **-33.6** | **-5,171.0** | **-2,217.3** | **-57.1** |
| **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ** | **208.7** | **292.4** | **40.1** | **2,457.6** | **2,773.8** | **12.9** |

මූලය :- ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

# 8. කෘෂිකාර්මික ණය සඳහා පොලී පහත දැමීම

*ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයේ අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක කරන කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රම 3 ක පොලී අනුපාතික රජයේ උපදෙස් මත 2010 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අඩු කිරීමට තීරණය කොට ඇත.*

ඒ අනුව නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය, දියර කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ ණය ක්‍රමය හා කෘෂි නවෝදය විශේෂ ණය යෝජනා ක්‍රමය යටතේ ගොවි ජනතාව වෙත සෘජුව මුදහරින ණය සඳහා අයකරන වාර්ෂික පොලී අනුපාතික පහත වගුවේ දැක්වෙන පරිදි 4% කින් අඩු කිරීමට පියවර ගෙන තිබේ.

| | ණය යෝජනා ක්‍රමය | කලින් පැවති පොලී අනුපාතය | නව පොලී අනුපාතිකය |
|---|---|---|---|
| 1. | නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය | | |
| | (අ) බෝග වගා ණය | 12% | 8% |
| | (ආ) ඉදිරි වෙළෙඳ ගිවිසුම් යටතේ කෘෂි ද්‍රව්‍ය මිලදී ගැනීම් සඳහා වන ණය | 12% | 10% |
| 2. | දියර කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ ණය ක්‍රමය | | |
| | (අ) කිරි ගව පාලන ව්‍යාපෘති ණය | 12% | 8% |
| | (ආ) කෘෂි බෝග හා කිරි සැකසුම් කර්මාන්ත සඳහා වන ණය | 14% | 12% |
| 3. | කෘෂි නවෝදය විශේෂ ණය යෝජනාක්‍රමය | 12% | 8% |

නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ වී ඇතුළු ක්ෂේත්‍ර බෝග 34 ක වගා කටයුතු සඳහා ගොවීන්ට මෙන්ම එම කෘෂිකාර්මික නිෂ්පාදන ඉදිරි වෙළෙඳ ගිවිසුම් ක්‍රමය යටතේ මිල දී ගැනීම සඳහා ගැනුම්කරුවන් වෙත කෙටි කාලීන ණය ප්‍රදානය කෙරෙන අතර ඒ යටතේ වර්ෂයක දී මුදාහැරෙන මුළු ණය ප්‍රමාණය රුපියල් බිලියන 10 ක් පමණ වේ. 2008 වර්ෂයේ රජයේ අයවැය යෝජනාවක් අනුව දිවයිනේ කිරි නිෂ්පාදනය නංවාලීම සඳහා හඳුන්වා දෙනු ලැබූ දියර කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 500 ක පමණ ණය මුදල් මේ වනවිට ප්‍රදානය කොට ඇති අතර ගොවීන් විශාල ප්‍රමාණයක් ණය පහසුකම් ලබා ගැනීම සඳහා කැමැත්ත ප්‍රකාශ කොට ඇත. එමෙන්ම රජයේ අයවැය යෝජනාවක් අනුව 2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ කෘෂි නවෝදය විශේෂ ණය යෝජනා ක්‍රමය මගින් ගොවි ජනතාවගේ කෘෂිකාර්මික හා සත්ව පාලන කටයුතුවලට අදළ මැදිකාලීන ණය අවශ්‍යතාවන් සඳහා ණය ප්‍රදානය කෙරේ.

මෙසේ කෘෂිකාර්මික කටයුතු සඳහා වන බැංකු පොලී අනුපාතික අඩු කිරීම සඳහා වන රජයේ වැඩ පිළිවෙළ තුළින් කෘෂිකාර්මික හා සත්ව පාලන අංශයන්හි නව ආයෝජනයන් සිදු කිරීමට ගොවි ජනතාව පෙළඹෙතු ඇතැයි අපේක්ෂා කෙරේ. ආහාර බෝග නිෂ්පාදනය ඇතුළු කෘෂිකාර්මික කටයුතුවල හා දියර කිරි හා අනෙකුත් සත්ව නිෂ්පාදන අංශවල විශාල වර්ධනයක් ඉදිරි කාලය තුළ ඇති වීමට මෙම නව ආයෝජනයන් හේතු වන අතර එය රජයේ ප්‍රමුඛ අරමුණු වන දේශීය ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම හා ගොවි ජනතාවගේ ආදායම් හා ජීවන තත්ත්වය නංවාලීම සඳහා උපකාරී වනු ඇත.

## 9. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.)
## 2007, 2008 සහ 2009

(2002 = 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 |
| ජනවාරි | 151.8 | 183.5 | 203.1 | 1.3 | 3.0 | -0.3 | 13.7 | 20.8 | 10.7 | 10.6 | 16.4 | 21.6 |
| පෙබරවාරි | 155.2 | 188.6 | 202.9 | 2.2 | 2.8 | -0.1 | 15.2 | 21.6 | 7.6 | 11.1 | 17.0 | 20.3 |
| මාර්තු | 155.0 | 191.9 | 202.0 | -0.1 | 1.7 | -0.4 | 15.1 | 23.8 | 5.3 | 11.7 | 17.7 | 18.6 |
| අප්‍රේල් | 156.3 | 195.4 | 201.0 | 0.8 | 1.8 | -0.5 | 14.3 | 25.0 | 2.9 | 12.3 | 18.7 | 16.7 |
| මැයි | 157.3 | 198.5 | 205.1 | 0.6 | 1.6 | 2.0 | 13.2 | 26.2 | 3.3 | 12.6 | 19.8 | 14.7 |
| ජූනි | 160.6 | 205.9 | 207.8 | 2.1 | 3.7 | 1.3 | 13.5 | 28.2 | 0.9 | 12.8 | 21.0 | 12.5 |
| ජූලි | 163.1 | 206.4 | 208.7 | 1.6 | 0.2 | 0.4 | 15.4 | 26.6 | 1.1 | 13.3 | 21.9 | 10.4 |
| අගෝස්තු | 165.2 | 206.3 | 208.1 | 1.3 | 0.0 | -0.3 | 16.5 | 24.9 | 0.9 | 13.8 | 22.6 | 8.5 |
| සැප්තැම්බර් | 166.7 | 207.2 | 208.6 | 0.9 | 0.4 | 0.2 | 16.1 | 24.3 | 0.7 | 14.2 | 23.2 | 6.6 |
| ඔක්තෝම්බර් | 171.8 | 206.6 | 209.4 | 3.0 | -0.3 | 0.4 | 18.2 | 20.2 | 1.4 | 14.8 | 23.4 | 5.2 |
| නොවැම්බර් | 176.4 | 205.2 | 211.0 | 2.7 | -0.7 | 0.8 | 19.3 | 16.3 | 2.8 | 15.4 | 23.0 | 4.1 |
| දෙසැම්බර් | 178.1 | 203.7 | 213.5 | 1.0 | -0.7 | 1.2 | 18.8 | 14.4 | 4.8 | 15.8 | 22.6 | 3.4 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව